ජනාධිපති කාර්යාලය
சனாதிபதி அலுவலகம்
PRESIDENTIAL SECRETARIAT

චක්‍රලේඛ අංක : PS/EAD/Circular/10/2023 මගේ අංකය: PS/EAD/02/14

2023 දෙසැම්බර් මස 22 වන දින

**සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්**
**සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්**
**සියලුම ආණ්ඩුකාර ලේකම්වරුන්**
**සියලුම දිසාපති/ දිස්ත්‍රික් ලේකම්වරුන්**
**සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ**
**රාජ්‍ය සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සභාපතිවරුන් වෙත,**

**ඩෙංගු රෝගය වැළැක්වීම සහ පාලනය**

මගේ අංක PS/EAD/Circular/06/2023 හා 2023 අප්‍රේල් 20 දිනැතිව නිකුත් කරන ලද චක්‍රලේඛයට වැඩිමනත් වශයෙනි.

ශ්‍රී ලංකාව තුළ මේ වන විට ඇති වී තිබෙන අයහපත් කාලගුණ තත්ත්වයන් හමුවේ ඩෙංගු රෝගය සීග්‍රයෙන් ව්‍යාප්ත වීමේ උග්‍ර අවදානමක් උද්ගත වී ඇති බැවින් එය ව්‍යාප්ත වීම වළක්වාගැනීම සඳහා සියලු ආයතනවල සක්‍රිය දායකත්වයෙන් යුතුව කඩිනමින් ඩෙංගු මර්දන වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතුය.

වර්තමාන සංඛ්‍යාලේඛන දත්ත අනුව, බස්නාහිර පළාත අධිඅවදානම් කලාපයක් ලෙස හඳුනාගෙන ඇති අතර, දිවයින පුරා රෝග ව්‍යාප්තිය සීග්‍රයෙන් වැඩිවීමේ ප්‍රවනතාවයක් පෙන්නුම් කරයි. මෙවැනි පසුබිමක් තුළ, ඩෙංගු රෝගය අධි වසංගත තත්ත්වයක් බවට පත්වීම වැළැක්වීම පිළිබඳව විශේෂ අවධානයක් යොමු කළ යුතු අතර, ඩෙංගු මර්දන කටයුතු ජාතික, පළාත්, දිස්ත්‍රික්, ආයතන, ග්‍රාමීය හා නිවාස මට්ටමින් සෞඛ්‍ය අංශවල සහයෝගය ද ඇතිව ක්‍රියාත්මක කිරීමට සියලු ආයතන ප්‍රධානීන් කැපවී කටයුතු කළ යුතු වේ.

මදුරුවන් බෝවීමේ අවදානම් සහිත ස්ථාන ලෙස හඳුනාගෙන ඇති රාජ්‍ය සහ පෞද්ගලික ආයතන, ඉදිකිරීම් පරිශ්‍ර, පාසල්, ආගමික ස්ථාන, ධීවර කටයුතු ආශ්‍රිත ප්‍රදේශ, නිවාස සහ නගර මධ්‍යයේ ඇති පොදු ස්ථාන පිළිබඳවද විශේෂ අවධානයක් යොමු කළ යුතුය.

ඒ සඳහා පහත පරිදි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන ලෙස අවධාරණය කරමි.

**1. <u>ආයතන තුළ ඩෙංගු මර්දනය හා පාලන කටයුතු සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග</u>**

1.1 තම ආයතන පරිශ්‍රය තුළ ඩෙංගු මදුරුවන් බෝ නොවන පරිසරයක් පවත්වා ගැනීම අදාළ ආයතන ප්‍රධානියාගේ වගකීම වේ. එබැවින් ඩෙංගු වලින් තොර පරිසරයක් ඇති කිරීම පිණිස, සියලු රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය ආයතන, පෞද්ගලික ආයතන,ඉදිකිරීම් පරිශ්‍ර, වැඩබිම්, පාසල් සහ ආගමික ස්ථාන ඇතුළු පොදු පරිශ්‍රයන්වල ඩෙංගු ව්‍යාප්තිය වැළැක්වීමේ සහ පාලනය කිරීමේ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සඳහා ආයතන ප්‍රධානීන් විසින් අවශ්‍ය පියවර ගත යුතුය.



ගාලු මුවදොර, කොළඹ 01 / காலி முகத்திடல், கொழும்பு 01 / Galle Face, Colombo 01
දුරකථන / தொலைபேசி / Telephones: ++ 94 (0) 11 2354418, ++ 94 (0) 11 2473873
ෆැක්ස් / தொலைநகல் / Fax: ++ 94 11 2446657
ඊ-තැපැල / மின்-அஞ்சல் / e-mail: prsec@presidentsoffice.lk

1.2 ආයතනය තුළ ඩෙංගු මදුරුවන් බෝවීමට හැකි අවදානම් ස්ථාන හඳුනාගැනීම, ඒවා ඉවත් කිරීම හා පසුවිපරම් කිරීම සම්බන්ධයෙන් සක්‍රියව දායක විය හැකි පුද්ගලයින්ගෙන් සමන්විත ආයතනික කමිටුවක් ස්ථාපිත කර, ඒ සඳහා නායකත්ව වගකීම් දැරීමට ක්‍රියාකාරී පුද්ගලයකු නම් කළ යුතුය.

1.3 අදාළ ආයතන තුළ ක්‍රියාත්මක කරනු ලබන කමිටු මඟින්, අනෙකුත් නිලධාරීන්ගේද සහාය ඇතිව ඩෙංගු මර්දන ක්‍රියාකාරකම් සෑම සතියකම සිකුරාදා දින පෙරවරු 9.00-9.30 කාලය තුළ ක්‍රියාත්මක කළ යුතු අතර අදාළ කාලය තුළ තම ආයතනයේ එම ක්‍රියාකාරකම් සිදු කරන බවට ආයතන ප්‍රධානීන් වගබලා ගත යුතුය.

1.4 තවද, එම ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් මෙම චක්‍රලේඛයේ ඇමුණුම 01 ලෙස ඇති ආකෘතිය ප්‍රකාරව වාර්තාවක් ආයතන ප්‍රධානීන් විසින් ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෙත මාසිකව ලබා දීමට කටයුතු කළ යුතුය. ඒ සඳහා ආයතනය තුල ඇමුණුම 02හි දක්වා ඇති ආකෘතිය ප්‍රකාරව වාර්තාවක් පවත්වාගෙන යා හැකිය.

1.5 ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී විසින් එම වාර්තා විශ්ලේෂණය කර නිරීක්ෂණය වන ප්‍රතිඵල අනුව අවශ්‍ය පරිදි තාක්ෂණික සහාය ලබා දෙනු ඇති අතර, අඛණ්ඩ නියාමනයක්ද ක්‍රියාත්මක කරනු ඇත.

1.6 තම ආයතනය සම්බන්ධයෙන් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී විසින් ලබාදෙන උපදෙස් අනුව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට ආයතන ප්‍රධානීන් පෞද්ගලික අවධානය යොමු කළ යුතුය.

## 2. <u>ඩෙංගු මර්දන හා පාලන කටයුතු මෙහෙයවීම, අධීක්ෂණය හා සම්බන්ධීකරණය</u>

2.1 ඩෙංගු මර්දන ක්‍රියාකාරකම් දීප ව්‍යාප්ත මට්ටමින් කාර්යක්ෂමව ඉටු කිරීමට අවශ්‍ය සියලු සම්බන්ධීකරණ කටයුතු ජාතික ඩෙංගු මර්දන ඒකකය මඟින් සිදු කළ යුතු අතර, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් යටතේ ජාතික ඩෙංගු මර්දන ඒකකය ශක්තිමත් කරමින් ඩෙංගු මර්දන ක්‍රියාකාරකම් බල ගැන්වීමේ ක්‍රියාන්විතයක් දියත් කළ යුතුය.

2.2 ඩෙංගු මර්දනය සඳහා පළාත්, දිස්ත්‍රික්, ප්‍රාදේශීය සහ ග්‍රාමීය මට්ටමේ පාර්ශව විසින් සෞඛ්‍ය අංශ වෙත සහයෝගය ලබා දිය යුතු අතර, ඒ පිළිබඳ තහවුරු කිරීම හා අදාළ පාර්ශවයන් සම්බන්ධීකරණය කිරීමේ වගකීම පළාත් ආණ්ඩුකාරවරුන් වෙත හා ඩෙංගු ව්‍යාප්තිය පාලනය කිරීම සඳහා පත්කරන ලද පළාත් අනුකමිටු වෙත පැවරේ.

2.3 පළාත් අනුකමිටු මසකට දෙවරක් රැස්විය යුතු අතර, එම සාකච්ඡාවලට තම පළාත තුළ ඩෙංගු වසංගත රෝග ව්‍යාප්තිය වැළැක්වීම හා පාලනය සඳහා වන සැලසුම් ඇතුළත් කරමින් ඒවායේ ප්‍රගතිය සමාලෝචනය කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සිදුකළ යුතුය. තවද, ප්‍රාදේශීය වශයෙන් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් හා කාර්යයන් සඳහා අවශ්‍ය මඟපෙන්වීම ලබාදෙමින් අදාළ ප්‍රදේශයේ මහනගර සභා, නගර සභා, ප්‍රාදේශීය සභා ඇතුළු පළාත් පාලන ආයතනවල සක්‍රිය දායකත්වය මත එම කටයුතු සිදු කළ යුතුය.

2.4 ඩෙංගු අධිඅවදානම් ස්ථාන ලෙස සැලකිය හැකි ඉදිකිරීම් පරිශ්‍ර, පාසැල්, ආගමික ස්ථාන ඇතුළු පොදු ස්ථාන සහ සෞඛ්‍ය අංශ විසින් ඩෙංගු අධිඅවදානම් ස්ථාන ලෙස නම් කරනු ලබන වෙනත් ඕනෑම ස්ථානයක් සම්බන්ධයෙන් පළාත් අනුකමිටුවේ විශේෂ අවධානය යොමු විය යුතුය. ජාතික ඩෙංගු මර්දන ඒකකය හා පළාත් අනුකමිටු විසින් ලබාදෙන මාර්ගෝපදේශ අනුව මෙම ස්ථානයන්හි ඩෙංගු ව්‍යාප්ත වීම වැළැක්වීමට අවශ්‍ය කටයුතු කඩිනමින් ක්‍රියාත්මක කළ යුතුය.

2.5 පළාත් සෞඛ්‍ය අධ්‍යක්ෂකවරුන් විසින් පාසැල්, අනෙකුත් අධ්‍යාපන ආයතන, ආගමික ස්ථාන ආදී පොදු ස්ථානවල ඩෙංගු මර්දන කටයුතු සංවිධානය කළ යුතු අතර සෞඛ්‍ය අමාත්‍යාංශයේ ජාතික ඩෙංගු මර්දන ඒකකය මඟින් අදාළ කටයුතු අධීක්ෂණය කළ යුතුය.

2.6 දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු, ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු හා ග්‍රාමීය කමිටුවලද විශේෂ අවධානය ඩෙංගු රෝග ව්‍යාප්තිය පාලනය සඳහා යොමු කළ යුතු අතර, ඒ සම්බන්ධයෙන් වන කරුණු සමාලෝචනය කිරීමට ඉහත රැස්වීම්වලදී අදාළ දිස්ත්‍රික් හා ප්‍රාදේශීය සෞඛ්‍ය නිලධාරීන් වෙත නිශ්චිත කාලයක් වෙන් කර දිය යුතුය.

2.7 ඩෙංගු මර්දනය අරමුණු කොටගෙන, ඉදිකිරීම් ගිවිසුම්වලට ඉදිකිරීම් පරිශ්‍ර සඳහා වන නීති රීති සහ සෞඛ්‍ය මාර්ගෝපදේශ ඇතුළත් කිරීමත්, හිස් ඉඩම්, අනේවාසික දේපල සහ ධීවර වරායන් ආශ්‍රිතව ඇති භාවිතා නොවන/අත්හැර දැමූ හෝ හිමිකරුවකු නොමැති බෝට්ටු යනාදිය තුළ ඩෙංගු මදුරුවන් බෝවීම වැළැක්වීම සඳහා නීතිමය ප්‍රතිපාදන ක්‍රියාත්මක කළ යුතු අතර, එවැනි ප්‍රතිපාදන නොමැති නම් ඒවා සම්පාදනය සඳහා නාගරික සංවර්ධන හා නිවාස, මහාමාර්ග, රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන, ධීවර හා සෞඛ්‍ය යන විෂය භාර අමාත්‍යාංශවල ලේකම්වරුන් කටයුතු කළ යුතුය.

2.8 ඩෙංගු රෝගය වසංගත තත්ත්වයක අවදානම පිළිබඳව ජාතික, පළාත් හෝ දිස්ත්‍රික් සෞඛ්‍ය අංශ විසින් දන්වා සිටින අවස්ථාවන් හි දී, අදාළ පාර්ශ්වයන්ගේ ක්‍රියාකාරී සහයෝගය සෞඛ්‍ය අංශ වෙත ලබාදීම ප්‍රමුඛ කර්තව්‍යයක් ලෙස සලකා කටයුතු කළ යුතුය. තවද, අවස්ථානුකූලව ඩෙංගු මර්දන හා පාලන කටයුතු සඳහා අවශ්‍ය මානව හා භෞතික සම්පත් ලබාදීමට අවශ්‍ය පියවර ගැනීම ආයතන ප්‍රධානීන්ගේ වගකීමක් ලෙස සලකා කටයුතු කළ යුතුය.

ඉහත සඳහන් ක්‍රියාකාරකම් සඳහා පමණක් සීමා නොවී ඩෙංගු රෝගය වසංගත තත්ත්වයෙන් පැතිර යාම වැළැක්වීමට ගත හැකි සියලු ක්‍රියාමාර්ග සඳහා ප්‍රමුඛත්වය දී කටයුතු කළ යුතු අතර, ඉහත උපදෙස් ඔබ යටතේ පවතින සියලු ආයතන වෙත නොපමාව දැනුම් දීමට අවශ්‍ය පියවර ගත යුතු වේ.

මේ සඳහා ඔබ සහ ඔබගේ කාර්ය මණ්ඩලය දක්වන සක්‍රිය දායකත්වය බෙහෙවින් අගය කරමි.

ස්තුතියි
මෙයට - විශ්වාසී

ඊ එම් එස් බී ඒකනායක
ජනාධිපති ලේකම්

දුරකතන: + 94 11 2354420 ෆැක්ස්: + 94 11 2446657
විද්‍යුත් තැපැල: prsec@presidentsoffice.lk

පිටපත්: අග්‍රාමාත්‍ය ලේකම්
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
විගණකාධිපති
ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය
ලේකම්, කොවිඩ්-19 සහ ඩෙංගු රෝගය රට තුළ ව්‍යාප්තිය පාලනය කිරීම සඳහා වන කමිටුව
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
අධ්‍යක්ෂ, ජාතික ඩෙංගු මර්දන ඒකකය

# ඩෙංගු මදුරුවන් බෝවන ස්ථාන පරීක්ෂා කිරීම පිළිබඳ මාසික වාර්තාව
## රජයේ ආයතන/ පෞද්ගලික ආයතන/පාසල් සහ අධ්‍යාපන ආයතන/ ඉදිකිරීම් පරිශ්‍ර/ ආගමික ස්ථාන/ ධීවර හා ධීවර වරායන් ආශ්‍රිතව

### සාමාන්‍ය තොරතුරු

| | | |
|---|---|---|
| ආයතනයේ නම | | |
| මාසය | | |
| සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාශය | | |
| ආයතන තුළ ඩෙංගු මර්දන කමිටුවක් | ඇත/නැත | |
| ආයතනය තුළ පවතින ඩෙංගු මර්දන කමිටුවේ සම්බන්ධිකාරකගේ තොරතුරු | නම | |
| | තනතුර | |
| | දුරකථන අංකය | |
| | විද්‍යුත් ලිපිනය | |

### ස්ථාන පරීක්ෂාව, දැනුවත් කිරීමේ වැඩසටහන් සහ ඩෙංගු රෝගීන් පිළිබඳ තොරතුරු

| | සති 1 | සති 2 | සති 3 | සති 4 | සති 5 |
|---|---|---|---|---|---|
| ➢ ආයතන ප්‍රධානියාගේ හා ඩෙංගු මර්දන කමිටුවේ අධීක්ෂණයෙන් සෑම සතියකම සිකුරාදා දින පෙ.ව.9.00-9.30 කාලය තුළ මදුරු මර්දන කටයුතු සිදුකරන ලදී | | | | | |
| ➢ අදාළ සතිය තුළ හඳුනා ගත් මදුරුවන් බෝවිය හැකි ස්ථාන ගණන | | | | | |
| ➢ අදාළ සතිය තුළ හඳුනා ගත් මදුරුවන් බෝවූ ස්ථාන ගණන | | | | | |
| ➢ අදාළ සතිය තුළ නිවැරදි කළ ස්ථාන ගණන | | | | | |
| ➢ නිවැරදි කිරීමට නොහැකි ස්ථාන පිළිබඳව සෞ. වෛ. නි. කාර්යාලයට දැනුම් දෙන ලදී | ඔව්/නැත | | | | |
| ➢ සෞ. වෛ. නි. කාර්යාලයෙන් අනතුරු ඇඟවීම් දීම / රතු නිවේදන නිකුත් කිරීම | ඇත/නැත | | | | |
| ➢ අදාළ මාසය තුළ ඩෙංගු හෝ ඩෙංගු යැයි සැක සහිත රෝගීන් වාර්තා වූයේද | ඔව්/නැත | | | | |
| වෙනත් කරුණු | | | | | |

මෙම වාර්තාව සහතික කරන නිලධාරියාගේ නම තනතුර සහ අත්සන: ..................................................

මෙම වාර්තාව ඊළඟ මාසයේ 10 වන දිනට පෙර ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෙත යොමු කරන්න. ඉදිකිරීම් පරිශ්‍ර සඳහා පමණක් මෙම වාර්තාව පළාත් පාලන ආයතන හා ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය (CIDA) වෙතද යැවීමට කටයුතු කරන්න

මෙම ඩෙංගු මර්දන ජාතික වැඩසටහන සඳහා ඔබ ආයතනය ලබා දෙන සහය ඉතා අගය කොට සලකමු

# ඩෙංගු මදුරුවන් බෝවන ස්ථාන පරීක්ෂා කිරීම පිළිබඳ මාසික වාර්තාව

රජයේ ආයතන/ පෞද්ගලික ආයතන/පාසල් සහ අධ්‍යාපන ආයතන/ ඉදිකිරීම් පරිශ්‍ර/ ආගමික ස්ථාන/ ධීවර හා ධීවර වරායන්

ආයතනයේ නම සහ ලිපිනය-

මාසය-

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාශය-

| මදුරු කීටයන් සහිත හෝ මදුරුවන් බෝවිය හැකි ස්ථාන | 1 සතිය | | 2 සතිය | | 3 සතිය | | 4 සතිය | | 5 සතිය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | හමු වූ ගණන | නිවැරදි කළ ගණන | හමු වූ ගණන | නිවැරදි කළ ගණන | හමු වූ ගණන | නිවැරදි කළ ගණන | හමු වූ ගණන | නිවැරදි කළ ගණන | හමු වූ ගණන | නිවැරදි කළ ගණන |
| ඉවතලන භාජන **(A 1)** සහ අයිතමයන් | | | | | | | | | | |
| ජල ටැංකි සහ ජලය රැස් කරන බඳුන් | | | | | | | | | | |
| ජලය නොබසින කානු සහ ගලි වලවල් | | | | | | | | | | |
| වැහි පීහිලි | | | | | | | | | | |
| පොකුණු සහ පක්ෂි තටාක | | | | | | | | | | |
| ජලය බැසීම අවහිර වූ මල් බඳුන් සහ තැටි | | | | | | | | | | |
| කොන්ක්‍රීට් ස්ලැබ් | | | | | | | | | | |
| ටයර් | | | | | | | | | | |
| ගස්බෙන/ බ්‍රොමිලියා ශාඛ | | | | | | | | | | |
| භාවිතා නොකරන වැසිකිළි උපාංග සහ ටැංකි | | | | | | | | | | |
| ශීතකරණ/ වායු සමීකරණ තැටි | | | | | | | | | | |
| මල් බඳුන් | | | | | | | | | | |
| වෙනත් **(A 2)** | | | | | | | | | | |
| **මුළු ගණන** | | | | | | | | | | |
| **පරීක්ෂා කළ දිනය හා පරීක්ෂාව මෙහෙයවූ නිලධාරියාගේ නම** | | | | | | | | | | |

- ඉවතලන භාජන හා අයිතමයන් ලෙස - **(A 1)**
  ප්ලාස්ටික් කෝප්ප,යෝගට් කෝප්ප,පොල් කටු, කිරි හට්ටි, බෝතල්, සෙල්ලම් බඩු කොටස්,පිඟන් කැබලි,ටින්, ලී පෙට්ටි, ඉවතලන පොලිතින් සීට්, ප්ලාස්ටික් දවටන, පොලිස්ටයිරීන් ද්‍රව්‍ය, බියර් කෑන් ආදිය සලකන්න.
- වෙනත් ස්ථාන ලෙස **(A 2)**
  පරිශ්‍ර ඇතුලත - ජලය එක් රැස් විය හැකි සඳලු තලල තාවකාලිකව ජලය රැස්වන ස්ථාන-වතුර කාන්දු වන ස්ථාන සඳහා යෙදූ බකට්ශ
  පරිශ්‍රවලින් පිටත - ඉවත්කල උළුකැටවල කැඩුණු ගොඩනැගිලි අයිතමල අබිලි ද්‍රව්‍යණිහුගත බටණිඇන්වෙනා බටල කැඩුණු වැසිකිළි වලවල්ණි වැසි ආවරණ සඳහා යොදා ඇති පොලිතින් දවටනල මුනින් නමා ඇති බකට් වල දාර.
- ආයතන පරිශ්‍රය නිරීක්ෂණයේදී මල්බඳුන්,ශීතකරණ/ වායු සමීකරණ තැටි,භාවිතා නොකරන වැසිකිළි උපාංග සහ ටැංකි නිරීක්ෂණය කරන්න. එහිදී සිස්ටන පියන ඔසවා නිරීක්ෂණය කරන්න. එමෙන්ම එතුල පවතින ගලි වලද නිරීක්ෂණය කල යුතුවේ. උඩු මහල් පරීක්ෂා කිරීමේදී ජලය රැස් [illegible]